**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය - 2020**

**-----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශනය**

**--------------------**

**1.1 තත්වාගණනය කල මතය**

**---------------------------------**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍යා ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.706,536,074 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එසේ වුවත්, මෙම වත්කම්වල ඵලදායි ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුව නැවත සමාලෝචනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ.<br>ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණ ද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින වත්කම් ඇතුලත් වත්කම් පන්ති හඳුනාගෙන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ ක්‍රියාවලිය දැනට සිදු කරමින් පවතී. මෙම කාරණය වර්ෂ ගණනාවක සිට සිදු කර නොමැති අතර මෙය සිදුකරගෙන යාමේදී ප්‍රායෝගික ගැටළු රාශියක් පැන නැගී ඇත. කෙසේ වෙතත් වර්තමානයේ පත් වූ කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති 01/2017 චක්‍රලේඛනයේ දැක්වෙන උපදෙස් ද උපයෝගී කර ගනිමින් කඩිනමින් මෙම ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය අවසන් කර වත්කම් වල සාධාරණ අගය (Fair Value) ගිණුම් ගත කිරීමට නියමිතයි. ප්‍රත්‍යාගණනය 2022 වර්ෂයේදී නිමකර ඉදිරිපත් කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිපත්ති 4.4 ප්‍රකාරව, ප්‍රාග්ධන ප්‍රදාන මත අත්පත් කරගනු ලබන වත්කම් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කරන බව මූල්‍ය | එකඟ වේ. ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වර්ෂ ගණනාවක් තුළ අධිකාරිය වෙත ලද | දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය |

| | | |
|---|---|---|
| ප්‍රකාශනවල දක්වා තිබුණද ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2002 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වර්ෂ 18 ක් තුළ අධිකාරිය වෙත ලැබී තිබුණු රු.මිලියන 2,671 ක් වූ වත්කම් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රදානයන් ක්‍රමක්ෂය කිරිම සම්බන්ධ ගැටළුව වර්ෂ ගණනාවක සිට පැවත එන්නක් වන අතර මේ සම්බන්ධව තොරතුරු අනාවරණය කර ගැනිම ඉතා ගැටළුකාරි තත්වයක පවති. කෙසේ නමුත් පවතින තොරතුරු පදනම් කර ගෙන 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිමේදී මෙම ප්‍රදානයන් ක්‍රමක්ෂය කිරිමට කටයුතු කරනු ලැබේ. | ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පාරිතෝෂික වෙන්කිරීම රු.82,147,340 ක් වුවද නිවැරදි පාරිතෝෂික වෙන්කිරීම රු.83,270,195 ක් වුයෙන් පාරිතෝෂික වෙන්කිරීම හා වර්ෂයේ පාරිතෝෂික වියදම රු.1,122,855 කින් අඩුවෙන් දක්වා තිබීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ පාරිතොෂික වියදම රු මි.ලි 3,464,795 කි සත්‍ය වශයෙන් මුදලින් ගෙවා ඇත්තේද රු මි.ලි 3,464,795 කි. | ප්‍රවර්ථන වියදම් නියමිත පරිදි ගණනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |
| (ආ) 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද වටිනාකම රු.195,063,403 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘතින් 09 ක් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල නොනිම් වැඩ ශේෂය තුළ දක්වා තිබුණි. එම ව්‍යාපෘතින් පරීක්ෂා කර වැඩ නිමකිරීමේ සහතික ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් භාවිතයට ගන්නා මෙම වත්කම්වල රු.7,358,187 ක් වූ ක්ෂයවීම් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද ව්‍යාපෘති වලින් වටිනාකම රු.75,658,354.80 වු ඉදිකිරීම් ව්‍යාපෘති නොනිම් වැඩ ගිණුමෙන් වත්කම් ගිණුමට දැනට මාරු කර ඇත. ඉතිරි ව්‍යාපෘති සඳහාද වැඩ නිමකිරීමේ සහතික ලබාගෙන අදාල වත්කම් ගිණුම් වලට මාරු කර ඊට අදාල ක්ෂය ගණනය කිරිම් මූල්‍ය ප්‍රකාශන වල නියමිත පරිදි දැක්විමට කටයුතු කරනු ලැබේ. | වැඩ නිමකිරීමේ සහතික අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කර මූල්‍ය ප්‍රකාශනවල ක්ෂයවීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. |
| (ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති සමුච්චිත අලාභය රු.1,841,071,525 ක් සමුච්චිත අරමුදල ලෙස මූල්‍ය ප්‍රකාශනයන්වල දක්වනු වෙනුවට ඒකාබද්ධ අරමුදල ලෙස දක්වා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඈ) නැවත අයකර ගත නොහැකි රු.8,418,371 ක් වූ එකතු කල අගය මත බදු මූල්‍ය ප්‍රකාශනයන්වල ගැලපීමට කටයුතු නොකර | එකඟ වේ. 2021/12/31 දිනෙන් නිවැරදි කිරිමට කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතු වීම |

ජංගම වත්කම් යටතේ හඳුනා ගැනීම හේතුවෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයගැතියන් තුළ ඇතුළත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික ඔලිම්පික් කමිටුව හා ක්‍රීඩා සංගම් 09 කින් අයවිය යුතු ශේෂවල එකතුව රු.8,982,811 ක් වුවද එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂවල එකතුව රු.3,004,959 ක් වුයෙන් මෙම ශේෂයන් අතර රු.5,055,523 ක වෙනසක් නිරීක්ෂණය විය. | කළමණාකාරීත්ව මණ්ඩල සාමාජික ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුළත් කමිටුවක් මඟින් බොල් ණය සම්බන්ධයෙන් කටයුතු කරන අතර 2022/01/06 වන දින වන විට රු 3,268,986.08 ක ශේෂයක් අයකර ගත් අතර මෙම විමසුමේ දක්වා ඇති රු 5,055,523.00 ක නොසැසදුණු ශේෂ සම්බන්ධයෙන් තවදුරටත් මෙතක් අය නොවී තිබූ ශේෂයන් පරීක්ෂා කර අය කර ගැනීමටත් නොසැසදුණු ශේෂ සම්බන්ධයෙන් කඩිනමින් ශේෂ නිරාකරණය කිරීමටත් කටයුතු කරනු ලැබේ. | නොසැසඳුණු ශේෂයන් හඳුනාගෙන නිවැරදිව ගිණුම්වල ගැලපීම් කළ යුතු වීම. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවියයුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 01 සිට 13 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන වටිනාකම රු.22,370,836 ක් වූ ලැබිය යුතු (වෙළඳ) ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | කළමණාකාරීත්ව මණ්ඩල සාමාජික ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුළත් කමිටුවක් මඟින් බොල් ණය සම්බන්ධයෙන් කටයුතු කරන අතර 2022/01/06 වන දින වන විට රු 3,268,986.08 ක ශේෂයක් අයකර ගත් අතර මෙම විමසුමේ දක්වා ඇති රු 5,055,523.00 ක නොසැසදුණු ශේෂ සම්බන්ධයෙන් තවදුරටත් මෙතක් අය නොවී තිබූ ශේෂයන් පරීක්ෂා කර අය කර ගැනීමටත් නොසැසදුණු ශේෂ සම්බන්ධයෙන් කඩිනමින් ශේෂ නිරාකරණය කිරීමටත් කටයුතු කරනු ලැබේ. | අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ) වර්ෂ 8 ක කාලපරිච්ඡේදයක සිට පැවත එන ලැබිය යුතු රඳවාගැනීමේ බදු රු.3,297,976 ක් ආදායම් බදු ගණනය | එකඟ වේ. අප අධිකාරිය විසින් ආදායම් බදු ගෙවීමට නොමැති බැවින් ආදායම් බදු ගණනය කිරීමේ | දීර්ඝ කාලයක සිට පැවත එන ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්වල |

| | | |
|---|---|---|
| කිරීමේ වාර්තාවල වාර්ෂිකව ඇතුලත් කර නොතිබීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකිව පැවතුණි. | වාර්තා වල ඇතුලත් කිරිමට අවශ්‍ය නොවුණි. | ගැලපීම් කළ යුතු වීම. |

### 1.6.2. ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරියේ මූලා ප්‍රකාශනවල ක්‍රීඩාගාර, ක්‍රීඩාපිටි හා පිහිනුම් තටාක වෙන් කර ගැනීම වෙනුවෙන් ගෙවන ලද ආපසු ගෙවන තැන්පතු වටිනාකම රු.16,675,900 ක් වූ අතර එම අගය තුළ 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පැවති තවදුරටත් වගකීමක් නොමැති රු.11,936,484 ක් වූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. 2021-12-31 අවසන් වර්ෂය සඳහා වසර දෙකක් ඇතුලත ආපසු ගෙවන තැන්පතු නිදහස් කිරීමටත් වසර 02 කට වැඩි තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. | දීර්ඝ කාලයක සිට පැවත එන ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) ව්‍යාපෘතින්වල ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි සිදු නොකිරීම නිසා වර්ෂ 01 සිට 06 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන රු.17,741,095 වූ රඳවාගත් මුදල්වල තවදුරටත් වගකීමක් නොමැති ශේෂයන් හඳුනාගෙන ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ.මෙම වටිනාකමට අදාල රඳවාගත් මුදල් මේ වන තෙක් ඉල්ලීම් කර නොමැති අතර අඩුපාඩු නොමැතිනම් මුදල් නිදහස් කිරීමටත් ඉතිරි මුදල් ආදායමට ගැනීමටත් කටයුතු කරනු ලැබේ. | තවදුරටත් වගකීමක් නොමැති ශේෂයන් හඳුනාගෙන ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 04 ක කාලපරිච්ඡේදයක සිට පැවත එන ගිණුම් 02 කට අදාළ ප්‍රාග්ධන අත්තිකාරම් වටිනාකම රු.11,072,007 ක් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි | එකඟ වේ. දැනට මෙම ව්‍යාපෘති වලට අදාල අවසන් බිල්පත් හා අන්තර් බිල්පත් ලැබී ඇති අතර එම බිල්පත් ගෙවීම් කිරිමේදී මෙම අත්තිකාරම් මුදල් හිලව් කිරිමට කටයුතු කරනු ලැබේ. | ප්‍රාග්ධන අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 880 හා 891 (1) | මුදල් භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර | එකඟ වේ. මුදල් අමාත්‍යාංශයේ ජාතික ගිණුම් | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණු අතර ඇප ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි | දෙපාර්තමේන්තුවෙන් ඇප තැබීම සම්බන්ධයෙන් චක්‍රලේඛන අනුව අප අධිකාරියට ගැලපෙන ඇප තැබීමේ ක්‍රමය තෝරාගෙන මුදල් භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර ඇප ලේඛනයක් තබා ගැනීමට කටයුතු කර ඇත. | |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | (i) සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනිමට කටයුතු කරනු ලැබේ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |
| | (ii) මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කර ගැනිමට කටයුතු කරනු ලැබේ | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.76,964,188 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 65,069,728 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,894,460 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් ආදායම රු. 118,221,194 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය 2006 නොවැම්බර් 1දින සිට කාර්තුවකට රු.750, 000 බැගින් වූ ස්ථාවර බදු කුලියට වසර 30ක බදු කාල සීමාවක් | බදු ගිවිසුම සංශෝධන කිරීම සම්බන්ධයෙන් යම් යම් උපදෙස් ලැබී ඇති අතර පැහැදිලි උපදෙසක් ලබා ගැනීම සඳහා අධිකාරියේ නීති අංශය හරහා නීතිපතිගෙන් උපදෙස් ඉල්ලා | අධිකාරිය වෙත ආදායම් අයකර ගැනීමේ කටයුතු විධිමත් පරිදි කළමනාකරණය කල |

| | | |
|---|---|---|
| සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු දීමට ගිවිසුම්ගත වී තිබුණි. එහෙත් යම්කිසි කාල සීමාවකට වරක් වෙළඳපල වටිනාකමට ගැලපෙන පරිදි බදු කුලිය සංශෝධනය කර ගැනීම සඳහා අදාළ කොන්දේසි බදු ගිවිසුමේ ඇතුළත් නොකිරිම හේතුවෙන් අධිකාරියට අයකරගත හැකි ආදායම අහිමි වී තිබුණි. තවද බදු ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ක්‍රිඩාංගනයේ සිදු කිරීමට එකඟ වූ ඉදිකිරීමේ ව්‍යාපෘති දෙකක වැඩ සිදු කර නොතිබුණි. | ඇත. එම උපදෙස් ලැබුණු පසු බදු ගිවිසුම් සංශෝධන කර ඒ අනුව කටයුතු කරනු ලැබේ. | යුතු වීම. |
| (ආ) 2015 වර්ෂයේ සිට පාරිතෝෂික දීමනා අරමුදලට අදාළ (Gratuity fund) මුදල් තැන්පත් කර ඇති අතර 2020 දෙසැම්බර් 31 දින වන විට ශේෂය රු.5,322,801 කි. එම මුදල් ඵලදායි ලෙස ආයෝජනය කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | මෙම වර්ෂයේදී පාරිතොෂික ගෙවීම් සඳහා පුනරාවර්ථන වියදම් යටතේ මුදල් අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කිරීමට ඉල්ලීම් නොකල අතර මෙම වර්ෂයේ සිට පාරිතෝෂික අරමුදලේ ඇති මුදල් වලින් පාරිතෝෂිත ගෙවීම් නිදහස් කරන අතර නිදහස් නොකරන මුදල ගණන් බලා ඵලදායීව ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ. | අරමුදල් ඵලදායි ලෙස ආයෝජනය කළ යුතු වීම. |
| (ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රිඩාංගනය පවරනු ලැබූ අවස්ථාවේ ක්‍රීඩාංගනයේ පැවති ක්‍රීඩා භාණ්ඩ උපකරණ වටිනාකම වූ රු.2,149,491 ක් 2020 මාර්තු 11 දිනැති අංක 31/2020 දරන කළමනාකරණ මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් අයකර ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි. නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටද මෙම අගය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බදු ගිවිසුම සංශෝධන කිරීම සම්බන්ධයෙන් යම් යම් උපදෙස් ලැබී ඇති අතර පැහැදිලි උපදෙසක් ලබා ගැනීම සඳහා අධිකාරියේ නීති අංශය හරහා නීතිපතිගෙන් උපදෙස් ඉල්ලා ඇත.එම උපදෙස් ලැබුණු පසු බදු ගිවිසුම් සංශෝධන කර ඒ අනුව කටයුතු කරන අතර තොග ආලාභය අයකර ගැනීම සම්බන්ධයෙන්ද එම උපදෙස් මත කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු අගයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ)කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කටයුතුවලදී භාවිතා කළ ජලය සහ විදුලිය සඳහා 2020 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ආයතන 14 කින් අයවිය යුතු එකතුව රු.2,048,660 ක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. 2021/12/31 දිනට රු.1,114,010.04 මුදලත් අදාල කොන්ත්‍රාත් ආයතන මඟින් අය කර ගැනිමට කටයුතු කර ඇත. ඉතිරි අයවිය යුතු මුදල් ගෙවන බිල්පත් මඟින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ කාර්යමණ්ඩලය නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතියේ වර්ෂ 2 ක හා මාස 5 ක කාල පමාවක් සුගතදාස එළිමහන් ක්‍රීඩාගාරයේ ප්‍රධාන දොරටුව හා අවට වානේ වැට ඉදිකිරීම් ව්‍යාපෘතිය වර්ෂ 2 ක කාල පමාවක් හා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ඇඳුම් මාරු කිරීමේ කාමර, වැසිකිළි හා ආපනශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ වර්ෂ 1 ක හා මාස 04 ක කාල පමාවක් 2021 දෙසැම්බර් 31 දිනට නිරීක්ෂණය විය. වැඩ නිම කිරීමේ අත්තිකාරම් සඳහා රු.28,878,856 ක් ගෙවා තිබුණු මෙම ව්‍යාපෘති නියමිත කාලය තුළ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘති තුනෙහි අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල රු.11,585,802 ක් අධිකාරිය වෙත පියවා ගැනීමට ප්‍රමාද වී තිබුණි. | නවාතැන් ගොඩනැගිලේ ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාලව එහි ඉදිකිරීම් කටයුතු සිදු කරගෙන යන අතරතුරදී කොවිඩ් 19 වසංගත තත්වය ඇතිවීම හා රට තුල සංචරණ සීමා පැනවීමත්, මෙම ගොඩනැගිල්ල රටේ අවශ්‍යතාවය මත නිරෝධානය වන පුද්ගලයන් හට නිරෝධාන මධ්‍යස්ථානයක් ලෙස ලබා දීම හා අමුද්‍රව්‍ය වල ගිහ බව හා කාළගුණික තත්වයන් සැලකිල්ලට ගෙන උපදේශක ආයතනයේ ඉදිකිරීම් කාලය දීර්ඝ කිරිමට නිර්දේශය ලබා දී ඇත. එමෙන්ම මෙම ව්‍යාපෘතියට අදාලව දැනට ගෙවීම් කර ඇති බිල්පත් වලින් ගිවිසුමට අනුව අත්තිකාරම් මුදල් පියවා ඇති අතර මේ වන විට අවසන් බිල්පත උපදේශක ආයතනය මඟින් පරික්ෂා කර අවසන් වෙමින් පවතින බව ප්‍රගති සමාලෝචන සාකච්ඡා වලදී දැනුම් දී ඇත. ඒ අනුව අවසන් බිල්පතෙන්, ඉතිරි පියවීමට ඇති අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන් පියවනු ලබයි. ඇඳුම් මාරුකිරීමේ කාමර හා ආපනශාලා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට අදාලව ව්‍යාපෘති කටයුතු 2018 වර්ෂයේ අවසන් කරන ලදි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය වසර 20 කට වඩා පැරණි ගොඩනැගිල්ලක් වන බැවින් මෙහි අලුත්වැඩියා කටයුතු සිදු කල නමුත් යම් යම් අඩුපාඩු මතුවීම හේතුවෙන් භාරදීම් හා භාරගැනීම් කටයුතු සිදු කිරිමට ප්‍රමාද වූ අතර අවසන් බිල්පත ගෙවීමටද ප්‍රමාද විය. මේ වන විට උපදේශක ආයතනය මඟින් අවසන් බිල්පත පරීක්ෂා කර මෙම අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති අතර එයින් සම්පූර්ණ අත්තිකාරම් මුදල පියවනු ලබයි. | අධිකාරිය වෙත අයවීම් අප්‍රමාදව පියවා ගැනීමට කටයුතු කළ යුතු විම. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ පාපන්දු ක්‍රීඩාපිටියේ අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීමේ කටයුතු 2011 ඔක්තෝම්බර් 13 දිනැති කොන්ත්‍රාත් ගිවිසුම අනුව මාස 6 ක කාලයක් තුළ නිම කිරීම සඳහා රු.32,000,000 (බදු රහිත) ක් වූ අගයකට පෞද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබුණි. ක්‍රීඩාපිටිය නිම කිරීමෙන් පසුද පැවති අඩුපාඩු හේතුවෙන් ක්‍රීඩාපිටිය භාවිතා කළ නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. මෙම ක්‍රීඩාපිටියේ අඩුපාඩු සකස් කරවා ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණු අතර මෙම කාර්යයන් සඳහා අධිකාරිය විසින් වැයකර තිබුණු රු.38,272,147 ක් ආපසු අයකර ගැනීම සඳහා නෛතික පියවර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කොන්ත්‍රාත් ආයතනය වෙත අඩුපාඩු දන්වා ලිඛිතව දැනුම් දෙන ලදී. ඒ අනුව විටින් විට කොන්ත්‍රාත් ආයතනය මඟින් අඩුපාඩු පිළිසකර කටයුතු සිදු කරන ලදී. එවක සිටි අධ්‍යක්ෂ මණ්ඩලය හා සභාපති තුමා විසින් නීතිපතිතුමාගේ උපදෙස් වලට අනුව ලංකාවේ එකම ජාත්‍යන්තර ආයතනය වන මෙම ක්‍රීඩාංගණය රටේ ක්‍රිඩකයින්හට ක්‍රීඩා ඉසව් සහ පුහුණුවීම් කටයුතු සිදු කිරීමට නොහැකි වීම නිසා නැවත ධාවන පථය හා ක්‍රීඩාංගණය නවීකරණ කටයුතු සිදු කරන ලදී. එමෙන්ම ව්‍යාපෘතියට අදාලව රඳවා ගැනීමේ මුදල් හා අවසන් බිල්පතේ කොටසක් වන රු මිලියන11 පමණ මුදල් කොන්ත්‍රාත් ආයතනය වෙත නොගෙවා රඳවාගෙන ඇත. | නිසි ප්‍රමිතියකින් තොරව ඉටු කරන ලද ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල අධිකාරිය වෙත ආපසු අය කරගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.4 මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට සහකාර අධ්‍යක්ෂ මාධ්‍ය, විදුලි යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක් හා අභ්‍යන්තර විගණක, නඩත්තු කටයුතු පිළිබඳ නිලධාරි, ප්‍රසම්පාදන නිලධාරි සහ ආරක්ෂක කළමනාකරු යන තෘතියීක මට්ටමේ තනතුරු 04 ක් ඇතුළුව මුළු පුරප්පාඩු 69 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | සහකාර අධ්‍යක්ෂ(පාලන),(තාක්ෂණ) යන තනතුරු 2020 වර්ෂයේදී පුරප්පාඩුව නොතිබුන බව කාරුණිකව දැනුම් දෙමි.මාධ්‍ය හා විදුලි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා බඳවාගැනීම් සිදු කිරීමට නව බඳවාගැනීම් පටිපාටිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.මෙතෙක් අනුමැතිය ලබ දී නොමැත. | අනුමත කාර්ය මණ්ඩලය අප්‍රමාදව බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |